# මහනුවර මහා නගර සභාව

# 2024 වර්ෂය සඳහා

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2024 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීමට සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගැනීම පිණිස නිෂ්පාදකයින්ගෙන්, ලියාපදිංචි ආයතනවලින් හෝ පුද්ගලයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**(01) සැපයුම්**

01 .ආයුර්වේද ඖෂධ වර්ග.

02 .බටහිර ඖෂධ වර්ග සහ වෛද්‍ය උපකරණ.

03 .ගිනි නිවීමේ උපකරණ (සවිකිරීම් ඇතුළුව)

04 සාමාන්‍ය ගබඩාද්‍රව්‍ය (යකඩ,ජී.අයි .පයිප්ප, කම්බි, නාන කාමර හා වැසිකිලි අමතර කොටස්, ප්ලාස්ටික් ජල ටැංකි, කොම්පොස්ට් බැරල්, සෙවිලි ද්‍රව්‍ය

05 .තීන්ත වර්ග සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය.

06 .සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ (ඉදල්, කොසු, වේවැල් කූඩා, ප්ලාස්ටික් කුණුකූඩා, විම්, හාපික්, සබන්වර්ග, පයිනෝල්, අත්වැසුම් ආදිය )

07 .පාවහන්, සපත්තු මේස් ආදිය.

08 .නිලඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග සහ ටී ෂර්ට්

09 .ක්‍රීඩා භාණ්ඩ සහ කාය වර්ධන උපකරණ ආදිය

10 .ටයර්, ටයර් ටියුබ් සහ බැටරි (වාහන සඳහා)

11 .රථ වාහන අමතර කොටස් (වෑන්, මෝටර් සයිකල්, ට්‍රැක්ටර්, ගල් රෝල්, ටිපර් ත්‍රීවීලර් රථ, බැකෝ ඇතුලු සියලු වාහන වල අළුත් සහ භාවිතා කරන ලද අමතර කොටස්)

12. කාර්යාල විදුලිඋපකරණ ( එකතු කිරීමේ යන්ත්‍ර,කේතල් විදුලි පංකා ආදිය)

13. CCTV කැමරා , ඇඟිලි සලකුණු යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපාංග

14. කාර්යාල උපකරණ ලී සහ වානේ ගෘහ භාණ්ඩ (රාක්ක,අල්මාරි,මේස,ලිපිගොනු කැබිනට් ප්ලාස්ටික් පුටු ආදිය )

15. පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ෆැක්ස් යන්ත්‍ර සහ අනු පිටපත් යන්ත්‍ර බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය)

16. විදුලි සේවාවන් සැපයීමට අවශ්‍ය උපාංග (වයර්/ස්විච්/බල්බ්/ප්ලග් ආදිය)

17. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය, පරිගණක රිබන් , කාට්රිජ් ටෝනර් ආදිය

18. මුද්‍රණ කටයුතු (මුද්‍රිත පෝර්ම සහ පොත්පත් , දින මුද්‍රා සහ රබර් මුද්‍රා)

19. ගොඩනැගිලි ද්‍රව්‍ය (වැලි,ගල් ,මැටල් ආදිය)

20. හියුම් පයිප්ප , කොන්ක්‍රීට් කණු , මායිම් ගල් , සිමෙන්ති බ්ලොක් ගල් , කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන ආදිය

21. සිමෙන්ති, කොන්ක්‍රීට් පෙර මුසු (Ready mix) , ප්‍රිමික්ස් ආදිය

22. ඉරන ලද දැව (ලෑලි ,පරාල ආදිය)

23. ලිහිසි තෙල්

24. ඉමල්පන් තාර

25. පොහොර සහ රසායනික ද්‍රව්‍ය (රසායනික පොහොර සහ සත්ව පොහොර)

26 ජලය පිරිපහදු කිරීමේ රසායනික ද්‍රව්‍ය

(හයිඩ්‍රොක්ලයිම් ,ඇලුමිණියම් ,සල්ෆේට් ,ක්ලෝරින් ,ටී.සී.එල්. පවුඩර් ආදිය)

27. ජල පොම්ප සඳහා බෙයාරිං

28. පීවීසී උපකරණ (ඩී.අයි.ජී.අයි. ජල නල උපාංග යනාදි භාණ්ඩ සහ අමතර කොටස්)

29. ජල මීටර් ,ජල පොම්ප ,ජල මෝටර් ,ජල පිරිපහදු කිරීමේ විදුලි උපකර ,ජල පිරිපහදු කිරීමේ පද්ධතියට අවශ්‍ය උපකරණ ආදි භාණ්ඩ සඳහා අවශ්‍ය අමතර කොටස්

30. පොත් ,පුවත්පත් , සගරා මිලදී ගැනීම

31 ආරක්ෂිත උපකරණ(කබා, හෙල්මට් ආදිය)

32 උද්‍යාන සඳහා අවශ්‍ය ගස් වර්ග, මල් පැල සහ තණ පිදලි

33. කැනපි, ටෙන්ට් රෙදි සහ තිර රෙදි ආදිය

34. පදක්කම් , පලිහ, පිත්තල නාම පුවරු, කුසලාන

35. විදුලි බලවේග කට්ටල (විදුලි කියත් ඩ්‍රිල් මැෂින් ආදිය)

02. **<u>සේවාවන්</u>**

36. ජල පොම්ප , ජල මෝටර් ,ජලය පිරිපහදු කිරීමේ පද්ධතිය අලුත්වැඩියා කිරීම

37. රෝනියෝ යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම

38. පරිගණක යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම

39. පුටු විවීම සහ පුටු කුෂන් කිරීම සහ අලුත්වැඩියාව

40. ඇඟිලි සලකුණු යන්ත්‍ර , CCTV කැමරා අලුත්වැඩියා කිරීම

41. වාහන කුලියට සැපයීම (ට්‍රැක්ටර්, මගී වාහන, ටිපර්රථ, කම්පැක්ටර් රථ, ගස් කපන යන්ත්‍ර ආදිය

42. ටයර් නැවත පිරවීම සහ පැරණි ටයර් මිලදී ගැනීම

43. යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ කුලියට සැපයීම

44. සම්පත් පියස භාණ්ඩ විකිණීම (කාඩ් බෝඩ් යකඩ පිත්තල ප්ලාස්ටික් සහ කැබලි කරන ලද ප්ලාස්ටික් ආදිය)

45. කැනපි පුටු පිගන් කෝප්ප ආදිය උත්සව භාණ්ඩ කුලියට සපයා ගැනීම

46. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව

47. වෙනත්

ඉහත සඳහන් එක් එක් සැපයුම් සහ සේවාවන් සඳහා වෙන් වෙන්ව ලියාපදිංචි වීම සඳහා එක් අයිතමයක් වෙනුවෙන් රු2300/- ක බඳු ඇතුලත් ගාස්තුවක් අය කරනු ලැබේ. 2023.10.02 සිට 2023.11.02 දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා මහා නගර සභාවේ සැපයුම් අංශයෙන් අයදුම්පත් ලබා ගත හැකි අතර නොඑසේ නම් අපගේ වෙබ් අඩවිය වන http://kandy.mc.gov.lk මගින් අයදුම්පත බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2023.11.02 දිනවේ. අයදුම්පත් සමග ව්‍යාපාර නාම ලියාපදිංචිකිරීමේ සහතිකයේ පිටපතක් හා වැට් බදු ගෙවන්නේ නම් ඒ සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළයුතු වේ.

මුදල් ගෙවීම දිවයින තුල පිහිටි ලංකා බැංකු ශාඛාවකට මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් , අංක 0000032764 දරණ ගිණුමට මුදලින් පමණක් ගෙවීම් සිදු කර ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතු වේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්"ගණකාධිකාරි (සැපයුම්), මහා නගර සභාව, මහනුවර" නමින් 2023.11.02 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි**

i. ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව අවශ්‍ය අවස්ථාවලදී වෙනත් මිලගණන් කැඳවා භාණ්ඩ මිලදී ගැනීමේ බලය මෙම සභාවට / නාගරික කොමසාරිස්ට ඇත.
ii. අවශ්‍ය අවස්ථාවලදී සාම්පල් හා ආකෘති ඉදිරිපත් නොකරන හා ඇණවුම් පරිදි නියමිත වේලාවට, ප්‍රමිතියට සහ උසස් ගුණාත්මක භාණ්ඩ නොසපයන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබිය හැකිය.
iii. භාණ්ඩ සැපයූ දින සිට අවම වශයෙන් දින 45 ක ණය පහසුකම් සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතුය.
iv. සැපයුම්කරුවන්ට අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබේ.
v. සෑම අයදුම්පතක් සමගම ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් වෙන වෙනම අමුනා එවිය යුතුවේ.

වැඩි විස්තර ගණකාධිකාරි(සැපයුම්)ගේ දුරකතන අංක 081-2232071 මගින් ලබා ගත හැකිය.

2023.09. 24 දින

මහා නගර සභාව

මහනුවර

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක

මහනුවර නාගරික කොමසාරිස්